# ජනහඬ නංවන කම්කරු සැමරුම


ශ්‍රී ලංකාවේ කම්කරු සැමරුම ඇරඹීම නිමිත්තෙන් මත දෙකක් ප්‍රකාශව තිබේ. ඉන් එක් මතයකින් කියැවෙන්නේ ඒ.ඊ. ගුණසිංහ මහතාගේ ප්‍රමුඛත්වයෙන් 1927 වසරේදී පළමුවරට එම සැමරුම ඇරඹි බවයි. එහෙත්, තවත් මතයකින් කියැවෙන්නේ ඒ.ඊ. ගුණසිංහ මහතාගේ ප්‍රමුඛත්වයෙන්ම 1933 වසරේදී සැමරුම ඇරඹි බවයි.

වර්තමානයේ මැයි පළමුවැනිදා යනු ශ්‍රී ලංකාවේ නිවාඩු දිනයකි. එය නිවාඩු දිනයක් බවට පත්කරනු ලැබුවේ 1956 වසරේදී මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුව නියෝජනය කළ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතාගේ මූලිකත්වයෙනි. කොයිහැටි වෙතත් ශ්‍රී ලංකාවේද හේමාකට් සිදුවීම මෙන්ම කම්කරු අයිතීන් වෙනුවෙන් ඉදිරිපත් වූ අවස්ථාවන්ද නැතුවා නොවේ. ඉන් එක් සිදුවීමක් වන්නේ 1929 වසරේදී ට්‍රෑම්කාර් වර්ජනයට සහභාගි වෙමින් එයට සහයෝගය දුන්නායැයි හඳුන්වන පොන්සිනාහාමි නම් වූ කාන්තාව ගෙන ගිය අරගලයයි. එදිරිවීර ආරච්චිගේ පොන්සිනාහාමි නමින් වූ ඇය ජීවත්ව වූයේ මරියකඩේ, සුදුවැල්ල හා කොළඹ යන ප්‍රදේශවලයි. පොන්සිනාහාමි මුල්වරට කම්කරු අයිතීන් වෙනුවෙන් සටන් කරන්නට ඉදිරිපත් වූයේ 1923 මහා වැඩවර්ජනයත් සමඟිනි.

### කම්කරු අයිතීන්

1886 වසරේ චිකාගෝහි කම්කරු අයිතීන් වෙනුවෙන් සටන්කළ සමයට ආසන්නයේදීම මෙරට තුළත් මහා පරිමාණයෙන් කම්කරු අයිතීන් වෙනුවෙන් සටන්කළ ව්‍යාපාර ඇරඹිණි. මේ සියල්ල ගොඩනැඟුණේ විදේශිකයින් පවා ශ්‍රී ලංකාවේ තම පාලන බලය අල්ලාගෙන සිටියා වූ කාලවලදීය. මූලික වශයෙන් සඳහන් කළ හැකි වැඩවර්ජනයක් වන්නේ මුද්‍රණ සේවකයන් විසින් 1893දී කළා යැයි සැලකෙන වැඩවර්ජනයන්ය. එය ශ්‍රී ලාංකේය ඉතිහාසයේ පළමුවරට සංවිධාන ශක්තියකින් යුතුව බිහිවූ කම්කරු අරගලයයි. මෙම අරගලය වෙනුවෙන් මුද්‍රිත සමාගම්වල මෙන්ම පුවත්පත් කාර්යාලවල සේවය කරන්නන් දහස් ගණනින් එක්වූ අතර, එය හැඳින්වූයේ එච්.ඩබ්ලිව්. කේව් සමාගමේ මුද්‍රණකරුවන් ආරම්භ කළ අරගලයක් ලෙසිනි. එහෙත්, මෙම වර්ජනය අසාර්ථකව දියාරු වීමෙන් පසු ඒ තුළින් 'මුද්‍රණ කම්කරුවන්ගේ සංගමය' නම් වූ පළමු වෘත්තීය සමිති ව්‍යාපාරය ඇරඹිණි. එමෙන්ම අතීතයේ අරගලයන් ගෙනහැරපාන තවත් එක් වර්ජනයක් වන්නේ යටත්විජිත පාලනය යටතේ 1986 වසරේදී දියත් වූ රෙදි අපුල්ලන්නන්ගේ වැඩවර්ජනයයි. මෙය ආරම්භ වූවා යැයි සැලකෙන්නේ මුද්‍රණ සේවකයින්ගේ වැඩ වර්ජනය සිදුව වසර තුනකට පසුවයි. ස්ත්‍රී - පුරුෂ භේදයකින් තොරව සියලුදෙනාම එකාවන්ව එකමුතුව සටන්කළ මෙකී වර්ජනය සති තුනක් පුරා දිග්ගැස්සෙමින් පැවැති බව කියැවේ.

ඉන්පසු 1900 දශකයේ පළමුවරට ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ඇතිවූ වැඩවර්ජනය ලෙසින් සඳහන් කළ හැක්කේ, 1906 අගෝස්තු මස 13 වැනිදා ආරම්භ කරන ලද මහා වැඩවර්ජනයයි. මෙම වර්ජනය ආරම්භ කිරීමට මුල්වූයේ කොළඹ නගර සභාව විසින් කරත්තකරුවන් වෙත පැනවූ නීතියයි. මෙහි සඳහන් වූයේ කරත්තය දක්කාගෙන යන අවස්ථාවේදී කරත්තය මත හෝ බෝන්ලීයේ වාඩිවී යාම තහනම් කිරීමයි. මෙම නීතියට එරෙහිව කරත්තකරුවන් බහුතරයක් දෙනා මෙම වැඩ වර්ජනය හා සම්බන්ධ වීමත් සමඟ එවක ප්‍රධානතම ප්‍රවාහන මාධ්‍යයක් වූ කරත්තයේ සේවය ඇනහිටිණි. ඒ කෙසේ වෙතත් මෙම වැඩවර්ජනය තුළින් කරත්තකරුවන් ඉතා විශිෂ්ට ජයග්‍රහණයක් ලබාගන්නට සමත් විණි. ඒ කොයිහැටි වෙතත් ශ්‍රී ලාංකේය ඉතිහාසයේ විශාලතම වැඩවර්ජනය ලෙසින් සඳහන් කළ හැකි වන්නේ 1920 මාර්තු 20දා කොළඹ වරායේ කම්කරුවන් ඇරඹි මහා වැඩ වර්ජනයයි. මේ වර්ජනය වෙනුවෙන් 5000ක පමණ දෙනා සහභාගි වූහ.



ශ්‍රී ලාංකේය ඉතිහාසයේ මහත් කතාබහට ලක්වූ වැඩවර්ජනය වන්නේ 1940 දශකයේ ආරම්භයේදීම ඇතිවූ 'මුල්ඔය' වතු කම්කරු සටනයි. මෙම වතු කම්කරු සටන ඇරඹියේ ජෙගනාදන් යනුවෙන් වතු සේවයේ යෙදී සිටි අයකුගේ හා ඔහුගේ බිරියගේ ස්ථාන මාරුව අවලංගු කරන ලෙසත්, දිනක වැටුප ශත දහසයකින් ඉහළ දමන ලෙසත් ඉල්ලා සිටීමෙනි. කෙසේ වුව මෙම වර්ජනය ඉතිහාසයේ ලියැවී තිබෙන්නේ මුල්ඔය කර්මාන්ත ශාලාව අවට පෙළපාළිකරුවන් එක්රැස් වී සිටියදී පොලීසිය කළ වෙඩි තැබීමෙන් කම්කරුවකු මිය යාමත් සමඟිනි. මියගිය පුද්ගලයා 'ගෝවින්දන්' නම් අයකු වූ අතර, පොලිස් වෙඩි පහරින් ඝාතනයට ලක්වූ ශ්‍රී ලංකාවේ ප්‍රථම වතු කම්කරුවා වන්නේ ද ඔහුය. එමෙන්ම ශ්‍රී ලාංකේය ඉතිහාසයේ තවත් කතාබහට ලක්වූ වැඩවර්ජනයක් වන්නේ 1980 ජූලි 05 වැනිදා ආරම්භ වූ වර්ජනයයි. එදා වර්ජනයට සහභාගිවූවන් මේ දක්වා හැඳින්වෙන්නේ ජූලි වර්ජකයින් ලෙසිනි. මෙය කතාබහට ලක්වූ මාතෘකාවක් වන තරමට වැදගත් වන්නේ සේවකයන් 40,000කට වඩා තම සේවය අහිමිව යාමයි. එවක පැවති රජය විසින් වර්ජනයට සහභාගිවූවන් සියලු දෙනාම පාහේ සේවයෙන් ඉවත් කිරීමට කටයුතු කළ අතර, සිරගත කිරීම් මෙන්ම පහරදීම් ද නොඅඩුව සිදුවිණි. වාර්තාවන්හි දැක්වෙන්නේ 39 දෙනෙකු සියදිවි හානිකරගත් බවයි. මෙහිදී පැවති එක් උද්ඝෝෂණයකදී පහරදීම් හමුවේ එක් කම්කරුවකු මිය යන්නට විය. එමෙන්ම 2011 වසරේදී ද කම්කරුවන් විසින් පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුප් පනතට එරෙහිව ගෙන ගිය උද්ඝෝෂණයේදී 2011 මැයි 30 වැනිදා සිදු වූ වෙඩිතැබීමකින් එක් අයකු මිය ගියේය.

### යුක්තිය


1987 මැයි පළමුවැනිදා යනු ශ්‍රී ලංකාවේ කම්කරුවන්ට තහනම් දිනයක් විය. එනම්, එවක පැවති ත්‍රස්ත කලබල හේතුවෙන් මැයි දින රැලි සැමරුම පැවති රජය විසින් තහනම් කිරීමයි. ඒ කෙසේ නමුත්, රජය දැනුම්දීම් තුට්ටුවකටවත් මායිම් නොකරමින් මව්බිම සුරැකීමේ ව්‍යාපාරය රැලියක් පවත්වන ලදි. ඒ සඳහා නාරාහේන්පිට අභයාරාමයට විශාල පිරිසක් එක්රැස් වූ අතර, ඔවුනට පහරදීම සඳහා විශාල පොලිස් බලඇණියක් ද සන්නද්ධව සිටියහ. කඳුළු ගෑස් සහ රබර් උණ්ඩ ප්‍රහාරයන්ගෙන් පසුව පොලීසිය වෙඩි තැබූ අතර, එහිදී ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලෙස්ලි ආනන්ද ලාල් හා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කිත්සිරි මෙවන් රණවක මිය ගියහ. තහනම් මැයි රැලිය ඔවුන්ගේ ජීවිතවල නැවතුම් තිත තැබුවේ එලෙසිනි.

කොයිහැටි වෙතත් කාලයෙන් කාලයට ලෝකයේ කවර තැනක හෝ කම්කරුවන් විසින් ඔවුන්ගේ අයිතීන් වෙනුවෙන් සටන් කිරීම යුක්ති සහගතය. ඒ සියලු දෙනාටම ඇති අයිතියකි. අයිතීන් මුවාවෙන් සිදු කෙරෙන පෞද්ගලික දේශපාලනික න්‍යායන් සිදුකෙරෙන අවස්ථාද නැතුවා නොවේ. එහෙත්, කවුරුන්, කෙලෙසින් කීවද මේ සියල්ල ලඝු වන්නේ කම්කරු දිනය ලෙසින් නම් වූ මැයි පළමුවෙනිදා යටතටය.

**රජිත බස්නායක**

---

# වෘත්තීය සමිති **එක්සත්ව කටයුතු කිරීම වැදගත්**



**ඇන්ටන් මාකස්**, ලේකම්,
වෙළෙඳ කලාපය සහ පොදු සේවක සංගමය

අපි සංගමයක් ලෙස රාජ්‍ය අංශය, අර්ධ රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශයේ වෘත්තීය සමිති එක්ව මෙවර මැයි දිනය සැමරීමට එක්ව සිටිනවා. අපිට තිබෙන අභියෝගවලට මුහුණදීමට නම් අපි එක්සත්ව කටයුතු කිරීම වැදගත්. ඒ නිසා ලෝක කම්කරු දිනය වෘත්තීය සමිති වශයෙන් ඒකාබද්ධව සැමරීම වැදගත්.

අපේ මැයි දින පෙළපාළිය මැයි පළමුවනදා උදේ 10.00ට කොටුව දුම්රියපොළ ඉදිරිපිටින් ආරම්භ කර ශ්‍රී සංඝරාජ මාවතින් පිටත්වෙලා පී.ඩී. සිරිසේන ක්‍රීඩාංගණයේදී මැයි දින රැලිය පවත්වනවා.

මෙවර 2025 මැයි දිනය සමරන්නට සිදුව තිබෙන්නේ ශ්‍රී ලංකාව පමණක් නොව ලෝකයටම ඉතාම අභියෝගාත්මක තත්ත්වයක් පැන නැඟී තිබෙන කාලයකදීයි. අමෙරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් ඉදිරිපත් කළ බදු ප්‍රතිපත්තිය සමඟ සෑම රටකටම වගේ බලපා තිබේ. ශ්‍රී ලංකාවේ අපනයන බොහෝමයකට මේක බලපානවා.

අපේ රටේ ඇඟලුම් කර්මාන්තයේ අපිට මීට පෙර තිබුණේ සියයට 12ක බද්දක් වුණත් දැන් ඒක සියයට 44ක් දක්වා වැඩිවී තිබෙනවා.

ඒ නිසා අපේ භාණ්ඩවල මිල වැඩි වෙනවා වගේම අනෙක් අතට අපේ වෙළෙඳපොළ ඇකිලෙනවා. ඒවගේම වෙනත් රටවලින් ආනයනය කරන භාණ්ඩවල බද්දත් වැඩිකර තිබෙනවා. ඒ අනුව අමුද්‍රව්‍ය මිලත් වැඩිවෙලා තිබෙනවා. එම වැඩි වූ මිලත් අපේ භාණ්ඩවලට එක් කිරීමට සිදු වෙලා. මේ නිසා කලින් පැවැති ආදායම සහ වියදම අතර පරතරය තවදුරටත් වැඩි වෙනවා. එම පරතරය පියවා ගැනීමට තිබෙන ඉඩකඩත් ඇහිරෙනවා.

ඒ වගේම ආණ්ඩුව වශයෙන් රටේ ආර්ථික වර්ධන වේගය සියයට 5කටවත් වැඩියෙන් තබාගත යුතුව තිබෙනවා. මොකද 2028 වසරේ සිට අපි අයි.එම්.එෆ්. එකට ණය ගෙවීම ආරම්භ කළ යුතුව තිබෙනවා.

ඒත්, දැනට තිබෙන තත්ත්වය අනුව ආර්ථික වර්ධන වේගය සියයට 3ක් වගේ පවතිනවා. එහෙම බැලුවොත් අපනයන ක්ෂේත්‍රයේ සිටින ශ්‍රමිකයන්ට මේක බරපතළ අයුරින් බලපානු ලබනවා.

---

# දරුවන්ගේ **අධ්‍යාපන ගැටලු විසඳා දෙන්න**



**ජෝසප් ස්ටාලින්**, ලේකම්
ලංකා ගුරු සංගමය

මෙවර ලෝක කම්කරු දිනයේදී ලංකා ගුරු සංගමය, උතුරේ විශ්වවිද්‍යාල සේවක සංගමය, ගොවි සංවිධාන, ධීවර සංවිධාන සහ සමාජ සංවිධාන යන සියල්ලම ඒකාබද්ධව යාපනයේ බස්නැවතුම්පොළ අසලින් ආරම්භ වන දැවැන්ත මැයි පෙළපාළියකින් සහ යාපනයේ පුස්තකාලය අසලදී මැයි රැලිය පවත්වනවා.

මෙහිදී ප්‍රධාන වශයෙන් අපේ පාර්ශ්වයෙන් 'ගුරු සහ විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතාව ඊළඟ තුනෙන් දෙක ලබාදිය යුතුයි' යන්න අපේ ප්‍රධාන ඉල්ලීම වෙනවා. ඊට අමතරව අපේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින ගැටලුවලට විසඳුම් ලබාදෙන ලෙස ඉල්ලනවා.

උතුරේ ජනතාව දැනට මුහුණදෙන ගැටලු විසඳීමට ඉල්ලා සිටිනවා. විශේෂයෙන් යුද්ධයෙන් පසුව දිය යුතු විසඳුම් එකක්වත් තවම ලබාදී නැහැ. අතුරුදහන්වීම් සම්බන්ධයෙන් ඒවගේම ඔවුන්ගේ ඉඩම් ප්‍රශ්නය, බලය බෙදා දේශපාලනික විසඳුමක් ලබාදීම වැනි කිසිවක් තවමත් ආණ්ඩුව සිදු කර නැහැ. ඒ නිසා එම ජනතාව මුහුණදෙන ගැටලුවලට විසඳුම් ඉල්ලා සිටිනවා. සියලු අරගලවල වර්තමාන රජයේ ඇමැතිවරු හිටියා. එවකට ඔවුන් වෘත්තීය සමිති නායකයෝයි. මේ නිසා වැඩකරන පංතිය මුහුණ දෙන ගැටලුවලට විසඳුම් ලබාදීම රජයේ වගකීමක්.

ඒවගේම ධීවරයන්ගේ ගැටලු සහ වතුකම්කරු වැටුප් ප්‍රශ්නය අපි කතා කරනවා. මේවා තමයි අපේ ප්‍රධාන ඉල්ලීම්. අතුරුදහන් වීම්වලට පිළිතුරු දෙන්නයි අපි ප්‍රබලව ඉල්ලා සිටිනවා.

රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කළත් විසිදහසේ ඉල්ලීම අනුව සිදු වෙලා නැහැ. ඊට අමතරව ගුරු සංගමයේ වැටුප් විෂමතා තුනෙන් දෙක ඉටුවෙලත් නැහැ. ඒවගේම අධ්‍යාපනය වෙනුවෙන් අය-වැයෙන් සියයට 6ක් වෙන්කරන පොරොන්දුව තවමත් ඉටුකර නැහැ. මෙවැනි නොවිසිඳුණු ප්‍රශ්න විසඳන්නැයි ආණ්ඩුවෙන් බල කර ඉල්ලීමයි අපි කරන්නේ. දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් විශාල මැදිහත්වීමත් කළත් පාසල් උපකරණවල මිල අඩු කරලා නැහැ. වැට් එක ඉවත් කළෙත් නැහැ. මේ නිසා දරුවන්ගේ අධ්‍යාපන ගැටලු විසඳා දෙන්නැයි ඉල්ලා සිටිනවා.

---

# කම්කරු අයිතිවාසිකම් **අවදි වෙන්නේ මැයි දිනයත් එක්කයි**



**ජී. ඩී. ඉන්දික පුෂ්පකුමාර**, ප්‍රධාන ලේකම්
ජාතික සේවක සංගමය



සමස්ත වැඩ කරන ජනතාව වෙනුවෙන් මුළු ලෝකයම සමරන මැයි දිනය ජාතික සේවක සංගමයේ සභාපති අකිල විරාජ් කාරියවසම් මහතා ඇතුළු සියලු නිලධාරි මණ්ඩලයේ සහ සමස්ත සාමාජිකයන්ගේ ශුභාශිංසන එක් කරනවා. ජගත් ප්‍රජාවගෙන් ලැබුණු මේ ශ්‍රේෂ්ඨ දිනය ශ්‍රී ලංකාව ඇතුළු ලොව බහුතරයක් රටවල් එකම දිනයක සමරනවා. මේ මැයි දිනයෙන් ලෝකයට ලැබුණු කම්කරු අණ පනත්, අයිතිවාසිකම් විශාලයි. මේ අවදිවීම වෙන්නේ මැයි දිනයත් එක්කයි. මේ අවදිවීමත් එක්ක දේශපාලන නායකත්වය වෙන්න පුළුවන්, අනෙකුත් වෘත්තීය සමිති වෙන්න පුළුවන් ඒ සියලු දෙනා යම් යම් ප්‍රඥප්ති සම්මත කර ගන්නවා. යම් යම් අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටිනවා. බොහෝ ඒවා ඊළඟ අවුරුද්දේදී හෝ අවුරුදු කිහිපයකින් ජයග්‍රහණය කරනවා. මේ ගොනුවීමත් එක්ක කුමන පක්ෂ, පාට යටතේ සැමරුවත් අවසානයේ රතු පැහැයෙන් යුක්තව ඒ දවසට එකතු වෙනවා.

අපි ජාතික සේවක සංගමය විදියට වැඩ කරන ලෝකයට දිනාගන්න ඕන කරුණු දෙකක් ගැන අවධානය යොමු කරනවා. රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පුද්ගලික අංශවල සියලු දෙනාගේ වැටුප් තලවල විෂමතා තියෙනවා. හැම රජයක්ම යම් යම් වැටුප් වැඩිවීම් කළා. එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ මහතා ජනපති සහ අගමැති කාලයේදී රුපියල් 10,000කින් රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ පුද්ගලික සේවකයන්ට වැටුප් වැඩිවීම් කළා. අනෙකුත් පක්ෂත් ඒ ඒ කාලවල යම් වැටුප් වැඩිවීම් කළා. දැනටත් මේ තියෙන වැටුප් තලවල ප්‍රශ්න ඉදිරි අවුරුදු දෙක තුළ නිරාකරණය කරන්න ඕනෙ කියන පණිවිඩය දෙනවා. වෘත්තීය සමිති බහුතරයක් දැන් මූලිකත්වය ගෙන කතා කරන්නේ වැඩ කරන තැන සේවක සුරක්ෂා රක්ෂණ යෝජනා ක්‍රමයක් වගේ ක්‍රියාත්මකවීම ගැන.

ඒ වගේම 2019 ජිනීවාවලදී ලෝක කම්කරු සංවිධානය 108 වැනි සැසිවාරයේදී වැඩ කරන ලෝකයේ ප්‍රචණ්ඩත්වය සහ හිංසනය පිටුදැකීමේ සම්මුතිය (C 190 සම්මුතිය) සම්මත කර ගත්තා. ශ්‍රී ලංකාව වෙනුවෙන් එවකට අත්සන් කළේ ජාතික සේවක සංගමයයි.

---

# අවම වැටුප **ගැන අපි විමසිල්ලෙන්**



**ජනක විජයපතිරත්න**, සභාපති
නිදහස් සේවක සංගමය

වැඩ කරන ජනතාව අති බහුතරයක් නියෝජනය කළ රජයක් වර්තමානයේ බලයට පත්වෙලා තියෙනවා. හැමදාම පාලක පක්ෂයට එරෙහිව, පැවැති රජයන්ට එරෙහිව වැඩ කරන ජනතාව වෙනුවෙන්, වැඩ කරන පන්තිය වෙනුවෙන්, විශේෂයෙන් කම්කරුවන් වෙනුවෙන් ඉල්ලීම් ඉල්ලපු, පෙළපාළි ගිය, එයට නායකත්වය දුන් අති බහුතරයක් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් බවට අද පත් වෙලා තියෙනවා. ඒ නිසා අපි හිතනවා, මේක සුවිශේෂී අවස්ථාවක් කියලා.

කම්කරු ජනතාවට ඇත්තටම මැයි දිනය සමරන්න ඒ ජයග්‍රහණය කොතරම්දුරට සැබෑ කම්කරුවාගේ ජයග්‍රහණයක් බවට පත් වෙලා තියෙනවා ද නැද්ද කියන ප්‍රශ්නය තමා දැන් තියෙන්නේ. සැබෑ ජයග්‍රහණයක් ලැබිලා නම් කිසිදු අන් දේශපාලන පක්ෂයකට වඩා වැඩි වගකීමක් වත්මන් රජයට තියෙනවා. ඔවුන් බලයට පත් වුණේ තනිකරම පීඩිත පන්තියේ, වැඩ කරන ජනතාවගේ අභිලාෂයන් සහ බලාපොරොත්තු වෙනුවෙන් තමන් පෙනී සිටින බව කියලා.

එනිසා අපි හිතනවා, ස්වාධීන වෘත්තීය සංගමයක් විදියට වත්මන් රජය ඒ තමන් ගැන ජනතාව තබා තිබෙන විශ්වාසය අකුරටම ඉටු කරමින් ඒ සඳහා සාධනීය මැදිහත්වීමක් වෙයි කියලා.

අපි නිදහස් සේවක සංගමයේ ස්වාධීන වෘත්තීය සමිතියක් විදියට මේ රජයේ හැසිරීම කොහොමද කියලා ඉතාම මධ්‍යස්ථව බලාගෙන ඉන්නවා. වර්තමානයේ දැවෙන ප්‍රශ්නයක් බලට පත්වෙලා තියෙන කම්කරුවන්ගේ EPF පිළිබඳ අර්බුදයේදී වගේම අවම වැටුපවත් තවම හිමි නැති මෙරට පෞද්ගලික අංශයේ සේවකයන් ගැන කරන මැදිහත්වීම ගැනත් අපි ඉතාම විමසිල්ලෙන් බලාගෙන ඉන්නවා.

---

# වෘත්තියේ සාධාරණත්වය ගෞරවනීයත්වය වෙනුවෙන් කැපවෙනවා



**සුභාෂ් කරුණාරත්න**, ප්‍රධාන ලේකම්
සමගි සේවක සංගමය

අපගේ සමගි සේවක සංගමය ප්‍රධාන විපක්ෂ පක්ෂය වන සමගි ජන බලවේගයට අනුබද්ධ වූ සේවක සංගමයයි. දැනටමත් අර්ධ රාජ්‍ය අංශවල සේවය කරන සාමාජිකයන් විශාල ප්‍රමාණයක් අපගේ සාමාජිකත්වය ලබමින් සිටිනවා. සේවක අයිතිවාසිකම්, සමාජයීය සමාදානය සහ ආර්ථිකය යථාර්ථය පිළිබඳව අපගේ සංගමය වගකීම් සහගතව සහ සජීවීව කටයුතු කරනවා. මේ මැයි දිනය සමස්ත සේවකයන්ගේ කැපවීම, අභිමිවීම් සහ අභියෝග පිළිබඳව සිහිපත් කරවන දිනයක් වෙනවා.

ලෝක මැයි දිනය සැමරීමට හේතු වූයේ ද එවන් ක්‍රියාදාමයක්. වැඩ කරන ජනතාවගේ සේවා මුරය පැය අටක් ලෙස ප්‍රකාශයට පත් කරන ලෙස අමෙරිකාවේ චිකාගෝ නගරයෙහි හේ මාර්කට් හිදී අසාධාරණයට එරෙහිව නැඟී සිටි කම්කරු පිරිසකගේ විරෝධතාව මර්දනය කිරීමට පොලීසිය යොදවා එල්ල කරන ලද වෙඩි ප්‍රහාරවලින් කම්කරුවන් ගණනාවක් ජීවිතක්ෂයට පත් වුණා. තවත් විශාල පිරිසක් තුවාල ලැබුවා. එම සිද්ධිය සිදු වූයේ 1886 වසරේ අද වැනි දිනකයි. එය සිහිපත් කරලීමට 1890දී මහා පෙළපාළියක් සහ රැලියක් පවත්වමින් ලන්ඩනයේ කම්කරුවන් ප්‍රථම වරට මැයි දිනය සැමරූ බවත්, පසු කාලීනව මෙය ලෝකයේ අනෙකුත් රටවල වෘත්තීය සමිති සහ දේශපාලන පක්ෂ අතරට ද පැතිරී ගිහින් මැයි පළවෙනි දින ලෝක කම්කරු දිනය ලෙස සමරනවා.

අපේ සංගමය සෑම සේවකයකුටම සාධාරණත්වය සහ ගෞරවය සහිත වෘත්තීය ජීවිතයක් ලැබෙන තෙක් එම අරමුණු සඳහා කැපවී සිටිනවා. සාම්ප්‍රදායික සහ ගතානුගතික වෘත්තීය සමිති ක්‍රමයෙන් බැහැරව සේවක සේව්‍ය දෙපාර්ශ්වයේම උන්නතිය වෙනුවෙන් ඇප කැපවී කටයුතු කිරීම අප වෘත්තීය සමිතියේ පරම අභිලාෂය වෙනවා.

---

# වැඩ කරන ජනතාවට **යහපත් කාලයක් අනිවාර්යෙන්ම එළඹේවි**



අන්තර් සමාගම් සේවක සංගමයේ
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය ලේකම් **පී. හෙට්ටිආරච්චි**

අප මෙවර සමරනු ලබන්නේ කලින් පැවැති මැයි සමරුවලට වඩා වෙනස් මැයි සමරුවක්. ඒකට හේතුව, අපේ රටේ පළමු වතාවට කම්කරු පන්තිය මූලික කර ගත් සමාජවාදී මූලධර්ම අනුගමනය කරනු ලබන ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ ජාතික ජන බලවේග ආණ්ඩුවක් යටතේ මැයි දිනය සැමරීමයි. එය දේශපාලන ජයග්‍රහණයකට වඩා මෙරට වැඩ කරනු ලබන ජනතාව ලබා ගත් ජයග්‍රහණයක් ලෙස සලකන්න පුළුවන්. මෙතෙක් කල් වැඩකරන ජනතාව අතට, සාමාන්‍ය ජනතාව අතට දේශපාලන බලය හුවමාරු වූ අවස්ථාවක් දක්නට ලැබුණේ නැහැ. ඒත් පසුගිය අවුරුද්දේ සැප්තැම්බර් මස 21වන දින අනුර කුමාර දිසානායක සහෝදරයා ජනාධිපති ධූරයට පත් වීමත් සමඟ සියල්ල වෙනස් වුණා. ඔහු වැඩ කරන ජනතාව පිළිබඳ අවධානය යොමු කරමින් වැටුප් වැඩි කිරීම් රැසක් පසුගිය අය වැය යෝජනාවලින් ඉදිරිපත් කළා.මෙතෙක් කල් රාජ්‍ය සේවය තුළ තිබූ වැටුප් තලවල අඩුපාඩු මෙන්ම පැවැති විෂමතා මෙන්ම අඩුපාඩුද නිවැරැදි කර ඉතිහාසයේ රාජ්‍ය අංශයට ලැබුණ ලොකුම වැටුප් වැඩිවීම පසුගිය මාසයේ පඩියට එකතු වුණා. එය රාජ්‍ය අංශයේ සේවකයන් ලැබූ විශාල ජයග්‍රහණයක් විදිහට වගේම වර්තමාන ආණ්ඩුව ලබාදුන් ජයග්‍රහණයක් විදිහටත් සඳහන් කරන්න පුළුවන්.

රාජ්‍ය අංශය පිළිබඳව පමණක් අවධානය යොමු කරන බවට වූ චෝදනාවක් පසුගිය කාලයේදී පෞද්ගලික අංශයෙන් එල්ල වූ චෝදනාවක් බවට පත්ව තිබුණා. ඒත් අපේ රටේ පෞද්ගලික අංශයේ විශාල සේවක පිරිසක් සිටිනවා. එම ප්‍රමාණය ලක්ෂ හැටකට වැඩියි. එයින් සියයට හැටකට වැඩි ප්‍රමාණයකටගේ වැටුප පහළ තත්ත්වයකයි තිබෙන්නේ. අනෙක් පිරිසට සෑහීමකට පත්විය හැකි වැටුපක් ලබා ගැනීමට හැකියාව තිබෙනවා.

ඒ අනුව පෞද්ගලික අංශයේ මූලික වැටුප මේ අවුරුද්දේ රුපියල් විසිහත්දහස දක්වා ඉහළ දැමීමට රජය මඟින් ගැසට් එකක් නිකුත් කිරීමට නියමිතව තිබෙනවා. ජාතික ජන බලවේග ආණ්ඩුව මුදල් නාස්ති කරන්නේ නැහැ. වංචාව දූෂණය නැහැ. එහි ප්‍රතිලාභ ලැබෙන්නේ වැඩ කරන ජනතාව වෙතයි. මේ ආණ්ඩුව සෑම සතයක්ම නාස්ති නොකර ජනතාව වෙනුවෙන් හැම සතයක්ම වියදම් කරන ආණ්ඩුවක්. ඒ නිසා මේ ආණ්ඩුවට පුළුවන්කම ලැබී තිබෙනවා සිස්ටම් චේන්ජ් එකක් කරන්න.

අප විශ්වාස කරනු ලබනවා කම්කරුවන් සහ වැඩ කරන ජනතාව වෙත යහපත් ප්‍රවේශයක් සහිත කාලයක් අනිවාර්යෙන්ම එළඹෙනු ඇති බවට.



**උදිත ගුණවර්ධන, දිල්හානි ජයවර්ධන, ඉරෝෂා දීපානි**